බස්නාහිර පළාතේ පළාත් සභාව
மேல் மாகாண மாகாண சபை
WESTERN PROVINCE PROVINCIAL COUNCIL

බස්නාහිර පළාතේ පළාත් සභාවේ සියළුම ගරු මන්ත්‍රීවරුන් වෙත,

## සභා රැස්වීම

2013 අගෝස්තු මස 06 වන දින කල් තැබීම අනුව, බස්නාහිර පළාතේ පළාත් සභාව 2013 අගෝස්තු මස 19 වන දින (සඳුදා) පෙ.ව. 9.30 ට බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාතේ පළාත් සභා ගොඩනැගිලි පරිශ්‍රයේ සභා ශාලාවේදී රැස්වෙන බව කාරුණිකව දැනුම් දෙමි.

න්‍යාය පත්‍රය මේ සමඟ ඇත.

සුනිල් විජේරත්න,
සභාපති,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2013.08.06 දින,
සභා ලේකම් කාර්යාලය,
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5වන මහළ, B පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

# බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම
# 2013 අගෝස්තු මස 19 වන දින පෙ.ව. 9.30 ට

# න්‍යාය පත්‍රය

I. සභාපතිවරයාගේ නිවේදන

II. ලිපි ලේඛන පිළිගැන්වීම

III. කාරක සභා වාර්තා පිළිගැන්වීම

IV. පෙත්සම්

V. ප්‍රශ්න

VI. නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා

VII. අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ

VIII. පෞද්ගලික පැහැදිලි කිරීම්

IX. සභාවේ රැස්වීම්

**ගරු සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලැබීමට:**

යෝජනාව :

"2013.08.06 දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභාවේදී එළ
එකඟතාවයට අනුව අද දින ( 2013.08.19 දින) විසිරයෑමෙන් අනතුරුව
සභාව 2013.09.03 දින පෙ.ව 9.30 ට රැස්විය යුතු අතර 2013.08.20 දි
(අඟහරුවාදා දින) සභා රැස්වීම නොපැවැත්වෙන දිනයක් ලෙස සලකා ක්‍රියා
යුතුය ."

## X. සභාවේ කටයුතු

ගරු සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලැබීමට

යෝජනාව :

" අද දින පොදු කටයුතු ප්‍රමුඛතාවය ගත යුතුය . "

02.

## XI. පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු

01. **ගරු සිරිකමල් පිලිෂියන් ද සිල්වා මන්ත්‍රීතුමා :**

'ශ්‍රී ලංකාව නිදහස් අධ්‍යපනය ක්‍රියාත්මක වන රටක් බව ප්‍රකාශිතය එහෙත් රට තුල මධ්‍යම රජය, පළාත් සභා, පෞද්ගලික, ජාත්‍යන්තර, යනුවෙන් පාසැල් පද්ධතියක් ක්‍රියාත්මකව ඇති බව අපි දනිමු. මේ අතරින් බහුතර පාසැල් සංඛ්‍යාව අයත් වන්නේ පළාත් සභාවලටය. මෙම පළාත් සභාව වාර්ෂික අය වැය මගින් ප්‍රතිශතයක් ලෙස වැඩිම මුදල් ප්‍රමාණයක් වෙන් කරනු ලබන්නේ ප්‍රධාන අමාත්‍යවරයා නියෝජන කරන අධ්‍යාපන අමාත්‍යංශයටය. එහෙත් අප පළාතේ පාසැල් නඩත්තුව සඳහා වාර්ෂිකව වෙන් කරනු ලබන මුදල ප්‍රමාණවත් නොවන බව බලධාරින් විසින්ම ප්‍රකාශ කිරීම හේතුවෙන්, දෙමව්පියන්, ආදිසිසුන්, සුභ පතන්නන් හා වෙනත් විවිධ ක්‍රම මගින් විදුහල් වල අඩුපාඩු සකස්කර ගන්නා බව නොරහසකි අවිධිමත් ලෙස සිදුවන මෙම ක්‍රියාවලිය නිසා දෙමාපියන්, සිසුන් පත් වන අපහසුතාවය මග හරවා ගැනීම සඳහා විධිමත් ක්‍රමෝපායක් කඩිනමින් සකස් කළ යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කරයි.' (යෝ/v(01)13/02)

02. **ගරු ලලිත් එල්ලාවල මන්ත්‍රීතුමා:**

"වර්තමානයේ පවතින පළාත් සභා හා පාර්ලිමේන්තු අනුපාත මැතිවරණ ක්‍රමය ඉදිරිපත් වන අපේක්ෂකයන්ට මෙන්ම ඡන්ද දායකයන්ටද ඉතා අපහසු ගැටළුකාරී මැතිවරණ ක්‍රමයක් වන බැවින්, ඉදිරියේදී පවත්වන සියළු මැතිවරණ නව පළාත් පාලන මැතිවරණ ක්‍රමය මෙන්, පළාත් සභා කොට්ඨාශ මට්ටමින්ද, පාර්ලිමේන්තු මැතිවරණය ආසන මට්ටමින්ද, පැවැත්වීමට කටයුතු කළ යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව රජයට යෝජනා කර සිටියි." (යෝ/v(01)13/04)

## XII. පොදු කටයුතු

01\. ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමා (බ.ප) විසින් ඉදිරිපත් කරනු ලැබීමට:.

### ආදාහනාගාර පිළිබඳ අතුරු ව්‍යාවස්ථා

(අත්තනගල්ල ප්‍රාදේශීය සභාව)

'1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 126(xiv) වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 122 වන වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව, අත්තනගල්ල ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද, "අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ, ආදාහනාගාර පිළිබඳ අතුරු ව්‍යවස්ථා" නම් වූ අතුරු ව්‍යවස්ථාවන්,

1989 අංක 12 දරණ පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු, 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 123 (1) වගන්තිය යටතේ, බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පලාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලි බල හා බලශක්ති හා වෙළඳ අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල අනුව අනුමත කර .

එම අනුමැතිය පිළිබඳ නිවේදනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1788/8 දරණ, 2012 දෙසැම්බර් මස 11 වැනි දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරන්නට යෙදුන අතර,

එකී අතුරු ව්‍යාවස්ථාවනට අවසර නොදීම නොකරන ලෙසට, යෝජනා කරමින් ම එම අතුරු ව්‍යවස්ථාවන්, 1989 අංක 12 දරණ පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 125 වන වගන්තිය යටතේ මෙම බස්නාහිර පළාතේ පළාත් සභාවට ඉදිරිපත් කරමි.'

02. ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමා (බ.ප) විසින් ඉදිරිපත් කරනු ලැබීමට:

## කුලී ත්‍රී රෝද රථ නවතා තැබීම විධිමත් කිරීම, පාලනය කිරීම
## සහ
## ගාස්තු අයකිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා

(කඩුවෙල මහා නගර සභාව)

"252 වන අධිකාරය වන මහා නගර සභා ආඥා පනතේ 267 වන වගන්තියේ (1) උප වගන්තිය සමග කියවිය යුතු එකී ආඥා පනතේ 272 වන වගන්තියේ 32 උප වගන්තිය යටතේ කඩුවෙල මහා නගර සභාව විසින් සාදන ලද කඩුවෙල මහා නගර සභා බල ප්‍රදේශය තුල කුලී ත්‍රී රෝද රථ නවතා තැබීම, විධිමත් කිරීම, පාලනය කිරීම සහ ගාස්තු අය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා" නම් වූ අතුරු ව්‍යවස්ථාවන්,

1989 අංක 12 දරණ පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ (2) වන වගන්තියේ (1) වන උප වගන්තිය සමග කියවිය යුතු වූ 252 අධිකාරය වන මහා නගර සභා ආඥා පනතේ 268 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලි බල හා බලශක්ති හා වෙළඳ අමාත්‍යවරයා වෙත පැවරි ඇති බලතල අනුව අනුමත කර.

එම අනුමැතිය පිළිබඳ නිවේදනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1788/8 දරණ 2012 දෙසැම්බර් මස 11 වන දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පලකරන්නට යෙදුන අතර, එකී අතුරු ව්‍යවස්ථාවන් ස්ථිර කරන ලෙසට යෝජනා කර සිටිමින් ම එම අතුරු ව්‍යාවස්ථාවන්, 1989 අංක 12 දරණ පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 252 අධිකාරය වන මහා නගර සභා ආඥා පනතේ 268 වන උප වගන්තිය යටතේ මෙම බස්නාහිර පළාතේ පළාත් සභාවට ඉදිරිපත් කරමි.

## XIII. සභාව කල් තැබීම

කේ.එච්.ඩී.කේ.සමරකෝන්
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2013.08.06 දින,
සභා ලේකම් කාර්යාලය,
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5වන මහල, B පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.